<u>**සන්නිවේදන කාර්යය සඳහා වාද්‍ය භාණ්ඩ භාවිතය.**</u>

- ශ්‍රී ලාංකීය සමාජයේ විවිධ අවස්ථාවන්හි බෙර වාදනය යොදා ගත් බවට මූලාශ්‍රගත තොරතුරු ලැබේ.
- "සන්නිවේදනය" යන වචනයෙන් මනා සේ ඇඟවීම,දැක්වීම හා ප්‍රකාශ කිරීම වැනි අදහස් ධ්වනිත වේ.
- සමාජයේ විවිධ ජනකොටස් අතර සම්බන්ධතා ඇති කර ගැනීමේදී සන්නිවේදනය ඉතා වැදගත් වේ.
- බෙර වාදන ශිල්පය ද එවන් සන්නිවේදන ක්‍රමයකි.

**රාජ්‍ය පාලන කටයුතුවලදී සන්නිවේදනය සඳහා බෙර යොදාගැනීම..**

අණ බෙර

- අණ බෙර වැයීම යනුවෙන් අදහස් කරන්නේ යම්කිසි රාජාඥාවක් දන්වා සිටීම සඳහා ජනතාව රැස් කර ගැනීමට විශේෂිත වූ බෙර පද කොටසක් වාදනය කිරීමයි.
- මේ සඳහා බහුල වශයෙන් යොදා ගන්නේ දවුල යි.
- දුටුගැමුණු රජු මහා සෑය බැඳීම සඳහා වඩුවන් රැස් කරවීමට අණබෙර වැයූ බව ථූපවංශයේ සඳහන් වේ.

රණ බෙර

- රාජ්‍ය පාලන කටයුතුවලදී "රණ බෙර" හෙවත් යුදබෙර වාදනයද සන්නිවේදනය උදෙසා සිදු වූවකි.
- යුද්ධය සඳහා පිරිස රැස්කරගැනීම, සේනා ගමන් කරන මඟ දැක්වීම, ඔවුන්ට ධෛර්යය, ශක්තිය, ජීවය ලබාදීම එහි අරමුණ විය.

වද බෙර වාදනය

- රාජ්‍ය පාලන කටයුතු හා සම්බන්ධ සන්නිවේදනයේදී "වද බෙර" වාදනය සිදු වේ.
- සොරකම්,මිනීමැරුම් ඇතුළු රාජ්‍ය විරෝධී ක්‍රියාවන්ට වරදකරුවන් වූ පුද්ගලයින් මරණ දණ්ඩණයට නියම වූ පසු උල තැබීම හෝ හිස ගසා දැමීම සඳහා ගෙන යාමේදී වද බෙර වයමින් ගිය බව ජන සාහිත්‍යයෙන් හෙළි වේ.

මළ බෙර වාදනය

- මළ බෙර යනු අවමංගල්‍ය උත්සව සඳහා යොදාගන්නා බෙර වාදනය යි.
- මෙම වාදනය රාජකීය අවමංගල්‍යයක දී අනිවාර්ය අංගයක් ව පැවති බවට සාධක හමු වේ.
- මළ බෙර වාදනය රජුගේ අභාවය සාමාන්‍ය ජනතාවට දැනුම් දීමට මෙන්ම නිළමේවරුන් ඇතුළු අනෙකුත් ප්‍රධානීන්ට අවමංගල්‍යයට සහභාගි වීමට කරන අණක් වශයෙන්ද යොදාගත් බවට කිය වේ.
- මේ සඳහා මුලින්ම යොදාගෙන ඇත්තේ පටහ බෙරයයි.
- පසුකලෙක දවුල සහ තම්මැට්ටම ද මේ සඳහා යොදාගෙන තිබේ.
- මළ බෙර වාදනයේදී දවුල සුදු රෙදි කඩකින් වසා වාදනය කිරීමද චාරිත්‍රයකි.

**ආගමික කටයුතුවලදී සන්නිවේදනය සඳහා බෙර යොදාගැනීම..**

- හේවිසි වාදනය බුදු සමය ව්‍යාප්ත වීමෙන් පසුව ක්‍රමයෙන් බෞද්ධාගමික මුහුණුවරක් ගත් වාදන ක්‍රමයක් බවට පත් විය.
- පුරාණයේ සිට බෞද්ධාගමික පුදපූජාවන්ට බෙර වාදනය සම්බන්ධ වූ බවට තොරතුරු රාශියක් මූලාශ්‍ර ග්‍රන්ථවල සඳහන් වේ.
- ස්ථූප පූජා, බෝධි පූජා, දළදා පූජා වැනි බෞද්ධාගමික වත් පිළිවෙත් සඳහා බෙර වාදනය යොදාගත් බව පිළිගත හැකි වේ.

**බෞද්ධාගමික පුද පූජා සහ බෙරය අතර තිබූ සම්බන්ධය**

- ආගමික සිද්ධස්ථාන ආශ්‍රිත ව පුද පූජාවලට බහුලව යොදාගෙන ඇත්තේ දවුල්, තම්මැට්ටම් හා හොරණෑ වාදනයයි. මේවා හේවිසි නමින් හැඳින්වේ.
- සන්නිවේදන කටයුතු පවත්වා ගෙන යෑමේදී විශේෂ වූ බෙර පද යොදා ගනිමින්, පුද පූජා පවත්වන අවස්ථා,වේලා සහ විශේෂිත දින පිළිබඳ අවට ජනතාවට දැනුම් දීමක් කර ඇති බවට සාධක හමු වේ.
- අලුයම් ධූරය ,මැදියම් ධූරය, හැන්දෑ ධූරය වැනි දෛනික ව කෙරෙන වාදන අංග ද දක්නට ලැබේ.
- මේ හැරුණු කොට දළදා වහන්සේ වෙනුවෙන් කෙරුණු විශේෂිත බෙර වාදන කොටස් ද පවතී.
- දළදා කරඬුව අඹරාව යටින් පිටතට වැඩම වීමේදී අඹරා හේවිසි නමින් ද, දළදා වහන්සේ මාලිගාව ඇතුළට වැඩම වීමේදී ගෙවැදුම් හේවිසි යනුවෙන්ද හේවිසි වාදනයන් පැවැත්වීම ඒ සඳහා නිදසුන් ය.

ඇගයීම් කාර්ය පත්‍රිකාව

- බෙර වාදනය සන්නිවේදන කටයුතු සඳහා යොදාගන්නා අවස්ථා තුනක් නම් කරන්න.
- යුද්ධ අවස්ථාවන් පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සඳහා කරනු ලබන වාදන විශේෂය කුමන නමකින් හැඳින්වේද ?
- සමාජීය කටයුතුවලදී සන්නිවේදනය සඳහා වාදනය යොදාගත් අවස්ථා පිළිබඳ හැඳින්වීමක් කරන්න.

D.A.H. මධූකා ගුණරත්න

මියනවිට කනිෂ්ඨ විද්‍යාලය